# කොවිඩ් 19 වසංගතය හමුවේ බැංකු කටයුතු සිදු කර ගන්නේ කෙසේද?




## හැකි සෑම විටම අන්තර්ජාල බැංකුකරණ සහ ජංගම දුරකථන යෙදවුම් වැනි ඩිජිටල් සේවා හරහා බැංකු කටයුතු සිදු කිරීමට යොමු වන්න

- ගිණුම් ශේෂය පිරික්සීම
- බැංකු ගිණුම් ප්‍රකාශන ලබා ගැනීම
- ගිණුමකින් තවත් (තමාගේම, තුන් වන පාර්ශ්වයක හෝ වෙනත් බැංකුවක) ගිණුමකට මුදල් යැවීම
- බිල්පත් ගෙවීම (විදුලි බිල්, ජල බිල්පත්, ස්ථාවර සහ ජංගම දුරකථන බිල්පත් යනාදිය)
- ණය කාඩ්පත් ගෙවීම්




## මුදල් ආපසු ගැනීම් සහ මුදල් තැන්පත් කිරීම් සඳහා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සහ මුදල් තැන්පතු යන්ත්‍ර (CDM) යොදා ගන්න

**ඔබට ළඟම ඇති**

**lanka pay**

**සලකුණ සහිත වෙනත් බැංකුවක ATM යන්ත්‍ර ඔස්සේ ද අවම ගාස්තුවකට යටත් ව මුදල් ආපසු ලබා ගත හැක**

**ඩිජිටල් සේවාවන් ඔස්සේ සපුරාගත නොහැකි බැංකු ගනුදෙනු සඳහා පමණක් බැංකු ශාඛා වෙත යොමු වීමට කටයුතු කරන්න**

## ඔබ බැංකු ශාඛාවට පැමිණීමේ දී පහත උපදෙස් තරයේ පිළිපැදීමට වග බලාගන්න



නියමිත පරිදි මුහුණු ආවරණ පළඳින්න



බැංකු පරිශ්‍රයට ඇතුළු වීමට පෙර ඔබේ දෑත් සෝදන්න



යම් මතුපිටක් ස්පර්ශ කරේ නම් විශබීජ නාශක දියර යොදා ඔබේ දෑත් පිරිසුදු කරගන්න



පෝරම ආදී ලියකිවිලි පිරවීම සඳහා තමාගේම පෑනක් රැගෙන ඒමට අමතක නොකරන්න




සෑම විටම සමාජ දුරස්ථභාවය පිළිපදින්න

## බැංකු පරිශ්‍රය තුල අනුගමනය කලයුතු ආරක්ෂිත ක්‍රියා පිළිවෙත් අනුගමනය කරන්න; ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සහය වන්න

අත්‍යාවශ්‍ය පුද්ගලයන් පමණක් බැංකුව වෙත පැමිණීමට කටයුතු කරන්න. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ළමුන් සහ ගර්භණී කාන්තාවන් වැනි අවදානම් අධික පුද්ගලයන් බැංකු පරිශ්‍රය වෙත පැමිණීම වැලැක්වීම සඳහා හැකි සෑම පියවරක්ම ගන්න

- ඔබට කැස්ස සෙම්ප්‍රතිශ්‍යාව හෝ උණ වැනි රෝග ලක්ෂණ පවතී නම් සහ/හෝ
- ඔබ covid-19 ආසාදිත පුද්ගලයෙකු හා සමීප සබඳතාවක් පවත්වා ඇතැයි දන්නේ නම් හෝ සැකයක් පවතී නම්

බැංකු ශාඛා වෙත පැමිණීමෙන් වලකින්න

## වංචනිකයන්ගෙන් ප්‍රවේශම් වන්න

ඔබගේ බැංකු ගිණුම් තොරතුරු, අනන්‍යතාවය තහවුරු කරගැනීමේ තොරතුරු ආදී පෞද්ගලික තොරතුරු විමසමින් ලැබෙන දුරකථන ඇමතුම්, විද්‍යුත් ලිපි සහ අනෙකුත් පණිවිඩ පිළිබඳ සැලකිලිමත් වන්න. එවැනි විමසීම් සඳහා කිසිවකටත් ඔබගේ පෞද්ගලික තොරතුරු ලබා දීමෙන් වලකින්න. එවැනි විමසීම් වල සත්‍ය/අසත්‍ය තාවය තම බැංකුවෙන් විමසා තහවුරු කරගන්න.

**අවශ්‍ය අමතර තොරතුරු/උපදෙස් සහ සහය සඳහා ඔබේ බැංකු ශාඛා හා සම්බන්ධ වන්න**

**තව දුරටත් සහය අවශ්‍ය වන්නේ නම්**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව අමතන්න**
☎ 0112477966 ✉ fcrd@cbsl.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
ශ්‍රී ලංකා මහ බැංකුව,
අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.
☎ 011 2477659 ✉ dbsd@cbsl.lk www.cbsl.gov.lk